# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයෙ
# පාර්ලිමේන්තුව

---

# 1996 අංක 3 දරන
# ලංකා ඉංජිනේරු ආයතනය
# (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1996 පෙබරවාරි මස 08 වන දින]

(ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.)

---

1996 පෙබරවාරි මස 09 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන
ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිළ : ශත 45 යි. තැපැල් ගාස්තුව : රු. 2.

# 1996 අංක 3 දරන ලංකා ඉංජිනේරු ආයතනය (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1996 පෙබරවාරි මස 08 වන දින.]

**එල්. ඩී.—ඕ. 33/94**

## 1968 අංක 17 දරන ලංකා ඉංජිනේරු ආයතනය පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

"ලංකා ඉංජිනේරු ආයතනය" යයි සඳහන් කරනු ලබන හා හඳුන්වනු ලබන ආයතනයක් 1968 අංක 17 දරන පනතින් සංස්ථාගත කර ඇති හෙයින් ද ;

එකී ආයතනයේ සාමාජිකයන් විසින් එහි නාමය "ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය" යනුවෙන් වෙනස් කිරීම පිණිස යෝජනා සම්මතයක් සම්මත කර ගෙන ඇති හෙයින් සහ එවැනි සංශෝධනයක් කිරීම මහජන අභිවෘද්ධිය සඳහා වන හෙයින් ද ;

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1996 අංක 3 දරන ලංකා ඉංජිනේරු ආයතනය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1968 අංක 17 දරන ලංකා ඉංජිනේරු ආයතනය පනතේ ලුහුඬු නාමයේ යෙදෙන "ලංකා ඉංජිනේරු ආයතනය" යන වචන වෙනුවට "ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය" යන වචන ආදේශ කිරීමෙන් ඒ ලුහුඬු නාමය මෙයින් සංශෝධනය කරනු ලැබේ. 1968 අංක 17 දරන පනතේ ලුහුඬු නාමය සංශෝධනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ හෝ යම් ලිඛිත නීතියක යම් විධිවිධානයක හෝ ඒවායේ යම් ඇති සටහනක හෝ ප්‍රධාන ප්‍රඥප්තියෙන් හෝ ඒ යටතේ නිකුත් කර ඇති, සාදන ලද, නියම කරනු ලැබූ හෝ බලය දෙන ලද යම් ඇප්වීමක, නිවේදනයක, ආකෘතියක හෝ වෙනත් ලේඛනයක "ඉංජිනේරු ආයතනය" හෝ "ලංකා ඉංජිනේරු ආයතන" හැඟවෙන යම් පද සම්බන්ධයක ද "ආයතනය" යන වචනය යොදන කවර හෝ අවස්ථාවක දී ඒ වචනය හෝ වචන වෙනුවට පිළිවෙලින් "ආයතනය" යන වචනය හෝ "ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය" යන වචන ආදේශ කරනු ලැබිය යුතු ය. ප්‍රධාන ප්‍රඥප්තිය හා වෙනත් ලිඛිත නීති සංශෝධනය කිරීම.

2 — ඩී 036531 — 6,130 (95/11)

ගිවිසුම් ආදිය සඳහා ආරක්ෂාව.

4. මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භවීමේ දිනයට පෙරාතුව සාදන ලද, තිබුත් කරන ලද, හෝ ලියා අත්සන් කරන ලද්දා වූද, “ලංකා ඉංජිනේරු ආයතනය” විසින් හෝ එහි නමින් එදිනට බලපැවැත්මෙන් තා වූ ද සෑම කොන්ත්‍රාත්තුවක්, ගිවිසුමක් හෝ වෙනත් සාධන පත්‍රයක් හෝ කවරාකාර වූ හෝ ලේඛනයක් මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භවීමේ දිනයේ සිට සහ ඉන්පසුව “ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය” විසින් හෝ එහි නමින් සාදන ලද, තිබුත් කරන ලද හෝ ලියා අත්සන් කරන ලද්දක් ලෙස සලකනු ලැබිය යුතු ය.

මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භවීමට පෙර කරන ලද ක්‍රියාවල වලංගු භාවය.

5. මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වීමේ දිනයට පෙරාතුවම ප්‍රධාන පුඥප්තියෙන් ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය වෙත පැවරී ඇති යම් බලයක් හෝ පැවරී ඇතැයි අදහස් කරන ලද යම් බලයක් ප්‍රකාරව ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් ක්‍රියාත්මක කරන ලද යම් බලයක් හෝ කරන ලද යම් ක්‍රියාවක් සියලු කාර්ය සඳහා, වලංගු ලෙස ක්‍රියාත්මක කරන ලද සේ සහ කරන ලද සේ සලකනු ලැබිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

6. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 5
(විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස් වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍ර
කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවී
එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.